# සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
# நலன்புரி நன்மைகள் சபை
# WELFARE BENEFITS BOARD

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு

**Ministry of Finance, Economic Stabilaization & National Policies**

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. | WBB/02/Notice/D/Div.S/2022 | ඔබේ අංකය / உமது இல / Your No | | දිනය / திகதி / Date | 2023.01. 18 |

සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත,

<u>සුබසාධක ප්‍රතිලාභ වැඩසටහන - 2022 ක්ෂේත්‍ර දත්ත එක් රැස් කිරීම</u>

උක්ත වැඩසටහනෙහි පළමු අදියර ඔබ සැමගේ සහයෝගය හා දායකත්වය මත දැනට සාර්ථකව නිම කර තිබේ. එහි දෙවන අදියර වන ක්ෂේත්‍ර දත්ත එක් රැස් කිරීම 2023.01.19 දින මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ආරම්භ කර ඇත. ඉදිරියේදී සියලු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල අයදුම්කරුවන්ගේ සියළු නිවාස ඒකක ආවරණය කරමින් සිදු කිරීමට නියමිතය.

02. ප්‍රායෝගික QR කේත මුද්‍රණය සහ ක්ෂේත්‍රයට ගොස් දත්ත එක් රැස් කිරීමෙහි ගැටලු අවම කර ගැනීම සඳහා එම කාර්යයන්හි ප්‍රායෝගික පුහුණුවක් ලබා ගැනීමට පද්ධතිය තුළ 2023.01.27 දක්වා පහසුකම් සලසා ඇති බව වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

03. ඒ අනුව දත්ත එක් රැස් කිරීම සඳහා නිළධාරීන් ක්ෂේත්‍රයට යැවීමේදී පහත සඳහන් කරුණු පිළිබඳ අවධානය යොමු කරමින් අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

1) දත්ත එක් රැස් කිරීමට ක්ෂේත්‍රයට යන නිළධාරියා ඔහු විසින් දත්ත රැස් කරනු ලබන ග්‍රාම නිලධාරී වසම සඳහා පද්ධතිය තුළ ලියාපදිංචි වී සිටී දැයි පරීක්ෂා කර බැලිය යුතුයි.
2) ක්ෂේත්‍රයට යන නිළධාරියා දත්ත රැස් කිරීම සම්බන්ධයෙන් දෙන ලද පුහුණු වැඩසටහනට සහභාගි වී ඇතිදැයි පරීක්ෂා කර බැලිය යුතුය. (ජංගම යෙදවුම් මෘදුකාංගය පරිහරණය සහ ප්‍රශ්නාවලිය සම්බන්ධයෙන්)
3) ක්ෂේත්‍රයට යන නිළධාරීන්ට සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය මගින් එවා ඇති ජංගම යෙදවුම් මෘදුකාංගය පිළිබඳ අත්පොත පරිහරණයට අවශ්‍ය කටයුතු සලසා තිබේ ද යන්න පිළිබඳ අවධානය යොමු කළ යුතුයි.
4) සුබසාධක තොරතුරු ඒකකයේ නිළධාරීන් (WBIU officers) QR කේත මුද්‍රණය සඳහා අවශ්‍ය පුහුණුව ලබා ඇති දැයි පරීක්ෂා කර බැලිය යුතුයි.
5) ක්ෂේත්‍ර දත්ත එක් රැස් කිරීමට පෙර සියළු ගණන් ගන්නා නිළධාරීන් විසින් ක්ෂේත්‍රයේ දත්ත එක් රැස් කිරීමේ ප්‍රායෝගික පුහුණුවක් ලබා ඇති ද යන්න පිළිබඳ අවධානය යොමු කළ යුතුයි.

සුබසාධක ප්‍රතිලාභ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඔබගෙන් ලැබෙන නිරන්තර සහයෝගය ඉතා අගය කොට සලකමි.

බී.විජයරත්න
සභාපති/කොමසාරිස්

O/C

පිටපත :- සියළුම දිසාපතිවරුන් - කරු.දැ.ගැ.ස.


කාර්යාලය / அலுவலகம் / Office: Tel: 009411- 2151481, 009411- 2484600/4117, Fax: 009411- 2151482
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / e-mail: welfarebenefitboard2016@gmail.com, info@iwms.wbb.gov.lk
වෙබ් අඩවිය / இணையதளம் / Website: www.wbb.gov.lk